# වාම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

10 කාණ්ඩය 05 කලාපය

2024 මැයි

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු.70.00


## ගැහැනුන්ට අඩුම වැටුප් ගෙවීමෙන් ලංකාව ලෝකයේ ඉහළින්ම

ලංකාව, ලිංගිකත්ව පදනමින් වැටුප් විෂමතාව ඉහළින් පවත්නා රටක් ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) වාර්තා පෙන්වා දෙයි.

ලංකාවේ ජනගහනයෙන් රැකියා නියුක්ත ස්ත්‍රී පුරුෂ අනුපාතයට සාපේක්ෂව සැලකීමේදී කාන්තා පාර්ශ්වය වෙත ලැබෙන වැටුප් වටිනාකම් සැලකියයුතු ප්‍රමාණයකින් අවම තත්වයක පැවැතී. පසුගිය දශකයක කාලයට අදාළ සංඛ්‍යාන ලේඛනවලට අනුව මේ අගයන් අඩුවීමක් නිරීක්ෂණය නොවේ. ස්ත්‍රී පුරුෂ ගෙවුම් විෂමතාවයේ ගෝලීය සාමාන්‍ය අගයට මෙන්ම පහළ මධ්‍යම ආදායම් ලබන රටවල්වල අනුපාතයන්ට සාපේක්ෂව ද ඉතා පහළ අගයක් ගනී. මේ සම්බන්ධව ප්‍රමාණවත් සාකච්ඡාවක් ජාතික දේශපාලන නායකත්වය හා සමාජ මත දක්වන්නන් අතර පවා පැන නැගී නොමැති බවද නිරීක්ෂණය වේ. වැඩ කරන පැය ගණනට අනුව වැටුප් නිර්ණය වන ශ්‍රම කණ්ඩායම්වලින් පහළම ආදායම් ලබන 40% අතරේ විෂමතාව විශාල අගයක් ගනියි. ඉහළම වැටුප් ලබන 30% අතර ස්ත්‍රී පුරුෂ ගෙවීම් විෂමතාව අවම අගයකට ළඟාවේ. අඩු අධ්‍යාපනයක් ලැබූ පිරිස් අතර හා අසංවිධිත කම්කරු ක්ෂේත්‍රවලින් මේ විෂමතාව වැඩිපුරම දක්නට ලැබේ. ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තයේ දී පුහුණු ශ්‍රමය අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරමින් එහි වැඩිපුර නියැලෙන කාන්තාවන් හට ස්ත්‍රී පුරුෂ වැටුප් විෂමතාව පිළිබඳව සාකච්ඡාවක් වත් නොගනියි. එහෙත් ඇසුරුම්කරණය වැනි තාක්ෂණික පුහුණුවක් අවශ්‍ය වන රැකියා තලවලදී ☞ 02 පිටුවට

# විදුලිය බලයත් සමාගම් අතට!

**ලංකා විදුලිබල මණ්ඩලය සම්පූර්ණයෙන්ම පෞද්ගලික සමාගම් අතට පවරාදීම සඳහා නව විදුලිබල පනතක් අප්‍රේල් 25 පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබීය. 'ශ්‍රී ලංකා විදුලිබල පනත' නම් මෙම කෙටුම්පතේ අරමුණ ලෙස දක්වා ඇත්තේ මෙතෙක් විදුලිබලය සම්බන්ධව මිලට ක්‍රියාත්මක වූ 1969 හා 2009 වසරවලට අදාළ පැරණි පනත් දෙකම අවිච්ඡින්න කිරීමය.**

එම පනත් ලංකාවේ විදුලි බල සැපයුම රාජ්‍ය නියාමනය යටතේ මහජන සේවාවක් ලෙස පවත්වාගෙන යෑම සඳහා සම්මත කර තිබූ අතර නව පනත් කෙටුම්පත බහුජාතික සමාගම් වෙත පවරාදීම වෙනුවෙන්ම සකස් කර තිබේ.

රටේ විදුලි බලය සම්බන්ධව රජයට හිමි තනි ඒකාධිකාරය අවසන් කිරීමත්, එම අවස්ථාව පෞද්ගලික සමාගම්වලට ලබා දීමත්, පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා ☞ 02 පිටුවට

## ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡා මැද මූල්‍ය අර්බුදය රතු ඉර පනී!

වසර මැද භාගය වන විට ආරම්භ වන යළි ණය ගැනීමෙන් ලංකාව තවත් මූල්‍ය අර්බුදයකට මුහුණ දිය හැකි බව මුදල් අමාත්‍යාංශයේ රහස්‍ය වාර්තාවක් අනාවරණය කරයි.

පසුගිය කාලයේ දේශපාලන වශයෙන් එකතැන පල්වීම සහ ආර්ථික අර්බුදය සාමාන්‍යකරණය වීමත් සමඟ ප්‍රධාන වශයෙන් මෙම ගැටලුව අවධානයට යොමු වී තිබේ. දේශීය ණය ගැනීම්වලින් රාජ්‍ය අරමුදල් තරකර ගැනීමේ හැකියාව ඉක්මනින්ම ඉතා පහළ මට්ටමකට පැමිණෙන බවට අනතුරු ඇඟවීමක් කෙරෙන එම වාර්තාව දැනටමත් මුදල් ඇමැතිවරයා ද වන ජනාධිපති රනිල් වික්‍රමසිංහ වෙත ඉදිරිපත් කර ඇත.

රාජ්‍ය වියදම් පියවා ගැනීම සඳහා ණය ගැනීම්වලින් රුපියල් ට්‍රිලියන 7කට අධික මුදලක් ලබාගැනීමට රජය සැලසුම් කර තිබූ අතර, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් ☞ 02 පිටුවට

## හම්බන්තොට නව තෙල් පිරිපහදුවක්, චීන සමාගම වැඩට බසී

හම්බන්තොට වරායේ කර්මාන්ත කලාපය තුළ නව තෙල් පිරිපහදුවක් ගොඩනැගීමට චීන 'සයිනොපෙක්' සමාගමට ආණ්ඩුව අවසර ලබා දී තිබේ.

මෙම ව්‍යාපෘතිය සඳහා ඩොලර් බිලියන 4.5 චීනය ආයෝජනය කරයි. එයට සමාන්තරව පිරිපහදුව ආශ්‍රිත වෙනත් නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ගොඩනැගීමටද අවසර ලබා දී තිබේ. ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා ඇති මෙම පිරිපහදුව ඉදිකිරීම සඳහා සැපයුම්, වරාය බදු, ජල සම්පත් කළමනාකරන කොන්දේසි සම්බන්ධව පුළුල් ලෙස සාකච්ඡා කර තිබේ. මීට අදාළව කැබිනට් මණ්ඩලය අනුමැතිය 2023 නොවැම්බර් 27 වනදා ලබා දී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2024 ජූනි මාසයේ දී ආරම්භ කිරීමට නියමිතය.

### වැඩකරන ජනතාවගේ දිනය වෙනුවෙන් සූදානම



මැයි 01 වැනිදාට යෙදෙන ජාත්‍යන්තර කම්කරු දිනය රැලියට අවශ්‍ය නිර්මාණාත්මක සූදානම් කිරීමේ කටයුතු වෙනුවෙන් වෙහෙසෙන පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ සහෝදරවරු

## පොලිස් අත්අඩංගුවේදී මරණ 24ක්!

2023 වසරේදී පොලිස් අත් අඩංගුවේදී මිය ගිය පුද්ගලයින්ගේ සංඛ්‍යාව 24 ක් බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වාර්තා කරයි.

අත්අඩංගුවට ගත් පුද්ගලයන්ගේ ආරක්ෂාව සැලසීම අදාළ පොලිසිය ස්ථානාධිපතිවරයාගේ පෞද්ගලික වගකීම බව සාමාන්‍ය පිළිගැනීම වේ. එහෙත් රහස් ස්ථානවල සඟවා ඇති ආයුධ පෙන්වීමට යාමේදී(?) සිදු වූ ගැටුම් නිසා. ආරක්ෂාවට තැබූ වෙඩි ප්‍රහාරවලින් ☞ 02 පිටුවට

## ඉන්ධන භාවිතය 50%කින් අඩුවේ!

රටේ ආර්ථික තත්වය හා පොදුජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව බිඳවැටීම සමග ඉන්ධන පරිභෝජනය 50%කින් අඩුවී ඇතැයි වාර්තාවේ.

ප්‍රමාණවත් තරම් ඉන්ධන තොග ගබඩා කර ඇතත් පෙරවසරවල වාර්ෂික පෙට්‍රල් පරිභෝජනය බැරල් 28,000ක් වුවද එය මේ වන විට බැර 14,000 දක්වා අඩුවී තිබේ.

සාමාන්‍යයෙන් රටක පෙට්‍රල් හා ඩීසල් පරිභෝජනයේ ප්‍රමාණය රටේ ආර්ථික ක්‍රියාවලියේ සංවර්ධන මට්ටම ප්‍රකාශ කරන එක් ☞ 02 පිටුවට

## මහා ව්‍යාපෘති සිය ගණනක් කොට උඩ! කොන්ත්‍රාත්කරුවෝ වන්දි ඉල්ලති

පසුගිය ආණ්ඩු විසින් ආරම්භ කළ මහා පරිමාණ ව්‍යාපෘති 35කට අදාළ කොන්ත්‍රාත් අවලංගු කිරීම නිසා එම ව්‍යාපෘති අකර්මණ්‍ය වී ඇති අතර ඒවාට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවෝ ආණ්ඩුවෙන් වන්දි ඉල්ලා ඇත.

මුදල් අමාත්‍යාංශ වාර්තාවකට අනුව, පසුගිය වසරේ මෙගා ව්‍යාපෘති 35කට සම්බන්ධ කොන්ත්‍රාත්තු 300කට අධික ප්‍රමාණයක් අත්හිටුවා ඇත. එයින් ව්‍යාපෘති 9ක කොන්ත්‍රාත්කරුවන් විසින් වන්දි වශයෙන් රුපියල් බිලියන 2.3ක් ඉල්ලා ඇත.

විදේශ විනිමය නතර කළ ව්‍යාපෘති 33 න් 17 ඇතුළුව මහා පරිමාණ ව්‍යාපෘති 37ක් පසුගිය වසරේ කිසිදු ප්‍රගතියක් ලබා නොමැති බවද වාර්තා වේ. කොන්ත්‍රාත්කරුවන්ගේ දුබලතා හේතුවෙන් තවත් ව්‍යාපෘති 41 ක ක්‍රියාත්මක කිරීමේ ☞ 02 පිටුවට

## ලංකාව සහ ඉරානය අතර නව ගිවිසුම් පහක්

අප්‍රේල් මාසයේදී මෙරට සංචාරයකට පැමිණි ඉරාන ජනාධිපති ඊබ්‍රාහිම් රයිසි දෙරට අතර අවබෝධතා ගිවිසුම් පහක් අත්සන් කිරීමේ අවස්ථාවටද සහභාගි විය.

සිය එක් දින සංචාරයේදී උමාඔය ව්‍යාපෘතිය විවෘත කිරීමේ අවස්ථාවට සම්බන්ධ වීමට ☞ 02 පිටුවට